

## සද්දන්තයන්ගේ පරාදීසය;

# මින්නේරිය වන උයන

**මින්නේරිය ජාතික වනෝද්‍යානය බලා අප කොළඹින් පිටත්වුයේ දහවල් 12.30 ට පමණ ය. කොළඹ සිට හබරන හරහා කිලෝමීටර 182 ක් ගමන් කර අඹගස්වැව උද්‍යාන මූලස්ථාන කාර්යාලයට ළඟාවන විට සවස පහ පමණ වී තිබුණි.**


ඉහළ ජෛව විවිධත්වයක් පවතින මෙම උද්‍යානය උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර් 8,889,411 වන භූමි ප්‍රමාණයක පිහිටා ඇත. තෙත් බිමක් වශයෙන් ද මින්නේරිය ජාතික වනෝද්‍යානය හඳුන්වනු ලැබේ.

පසුද පාන්දර 5.30 වන විට අපේ චාරිකාව සඳහා කලින් සූදනම් කර ගත් ජීප් රථය පැමිණ තිබුණි. ටාටා වර්ගයේ ජීප් රථයක් වූ එය ඉතා උස එකකි.

එය අපගේ අවශ්‍යතාවට කදිමට ගැලපෙන වර්ගයේ ජීප් රථයක් විය. ජීප් රථය කෙමෙන් කෙමෙන් වනෝද්‍යානයේ ගුරු පාර දිගේ ගමන් කරමින් තිබිණි. හිමිදිරියේ කුරුලු නාදය අවට ප්‍රදේශය පුරා පැතිරී තිබිණි. තවමත් හරිහැටියට එළිය වැටී නොතිබිණි. හිමිදිරි අළුයම අවට රජ කළේය.

බුරුත, මිල්ල, කළු වැදිරිය, හල්මිල්ල, වීර වැනි ගස් පසු තරමින් වාහනය ඉදිරියට ඇදෙයි. කාගේත් ඇස් වනය දෙසට යොමු වී තිබිණි. ක්ෂණිකවම අපට දැක ගත හැකිවුයේ යම් කිසිවක් අප යන පාර මැද වැතිරී පවතින ආකාරයයි. මිය ගිය ලොකු වඳුරෙක් ද නැති නම් කොටයක් ද ? එය තවත් හොඳින් දැකබලා ගැනීමට ජීප් රථය තව තවත් කිට්ටු කළෙමු. නිශ්චලව වැතිරී තිබූ දෙයට පණ ආවේය. එක වර හිස එසවුයේය. අප දෙස බැලුවේය. ඒ ක්ෂණයකින් වනට තුළට අතුරුදහන් විය. ඒ අලංකාර දිවියෙක් විය. ඇත්තෙන්ම තරුණ දිවියෙක් විය. වලිගයත් සමග සිරුර දිග අඩි හයක් පමණ විය. අවාසනාවක මහත ! අපේ කැමරාවල සටහන් කර ගන්නට තරම් මොහොතක් හෝ ඌ අපට ලබා නුදුන්නේය. එහෙත් දිවියා දැක ගැනීමට තරම් අපි වාසනාවන්ත විමු.

"මං අවුරුදු තුනක් මේ උද්‍යානයේ වාහන වලින් සංචාරකයන් රැගෙන එනවා. අද තමයි දිවියා දැක්කේ " අපේ රියදුරා කිවේය.



වියළි කලාපීය වනාන්නතරවල දැකිය හැකි කටු උණ, වල් ඉඳි, පොහොන් හා විවිධ තෘණ වර්ග මින්නේරිය උද්‍යානයට තර්ජනයක් වී ඇති අයුරු අපට පෙනුණි. ඒ ප්‍රදේශය කටු කැළේ වශයෙන් හඳුන්වන්නට වන ජීවි සේවකයන් පුරුදු වී සිටිති. ඒ ප්‍රදේශය පසු කර අපි මින්නේරිය වැව් තාවුල්ලට පැමිණියෙමු. උද්‍යානය ආශ්‍රිතව ඇති මින්නේරිය ජලාශයට ප්‍රධාන ජල සැපයුම් මාර්ගය වන්නේ යෝධ ඇළ මඟින් ගලා එන මහවැලි ජලයයි. බටු ඔය, ඊරිගේ ඔය, හල්තොට ඔය, කිරි ඔය, මඩයම්පල ඔය, යන ඔය වලින් ගලා එන ජලය මින්නේරිය ජලාශයේ ප්‍රදේශවලට එක්වෙයි. එයින් සුළු වශයෙන් ජලාශයට ජලය එකතුවන බව අපට දැක ගත හැකි විය.

"මං ඔය දක්කමයි" වසර එක හමාරක අත්දැකීම් ඇති අපේ මග පෙන්වන්නා පුෂ්පකුමාර කීවේය.

කැප්පෙටියා, කුකුරුමාන, වරා වැනි ශාකද පසුකරමින් අපි ඉදිරියට ගියෙමු. අපේ ජාතික පක්ෂීන් ජෝඩුවක්, වලි කුකුළන් ජෝඩුවක් පාර හරහා දිවගොස් පඳුරු අතරට වැදුණේය. පිල් හැළුණු මොනරෙක් සෙබඩ ද සමග අප එනු දැක මග හැර ගියේය. වඳුරෝ සහ රිලවු හඬ නගමින් අත්තෙන් අත්තට පනිමින් ආගන්තුකයන්ගේ අවතීර්ණය සෙසු සතුන්ට දැන්වූවෝය.

වියළි කලාපීය වනාන්නතරවල දැකිය හැකි කටු උණ, වල් ඉඳි, පොහොන් හා විවිධ තෘණ වර්ග මින්නේරිය උද්‍යානයට තර්ජනයක් වී ඇති අයුරු අපට පෙනුණි. ඒ ප්‍රදේශය කටු කැළේ වශයෙන් හඳුන්වන්නට වන ජීවි සේවකයන් පුරුදු වී සිටිති. ඒ ප්‍රදේශය පසු කර අපි මින්නේරිය වැව් තාවුල්ලට පැමිණියෙමු. උද්‍යානය ආශ්‍රිතව ඇති මින්නේරිය ජලාශයට ප්‍රධාන ජල සැපයුම් මාර්ගය වන්නේ යෝධ ඇළ මඟින් ගලා එන මහවැලි ජලයයි. බටු ඔය, ඊරිගේ ඔය, හල්තොට ඔය, කිරි ඔය, මඩයම්පල ඔය, යන ඔය වලින් ගලා එන ජලය මින්නේරිය ජලාශයේ ප්‍රදේශවලට එක්වෙයි. එයින් සුළු වශයෙන් ජලාශයට ජලය එකතුවන බව අපට දැක ගත හැකි විය.

මෙසේ අප කණ්ඩායම වැව් තාවුල්ල දිගේ ඉදිරියට ඇදෙන්නට විය. මෙහිදී අපට දේශීය මෙන්ම විදේශීය පක්ෂීන් ද දැකගත හැකිවිය. දේශීය පක්ෂි විශේෂ අතර දියකාවුන්, කළපු කොකුන්, හොට සුදු පැස්කුඹුවන් මින්නේරිය ජලාශයේ තරගයට මෙන් මාළු ආහාරයට ගන්නා අන්දම අපූරුය. ඒ අතර ලතු වැකියන්, ගල් හාරන්න දැක ගත හැකිය. එසේම ගිරා මලිත්තා, ලංකා බුදුන් බොර දෙමළිච්චා, අලු කැඳැත්තා, යන පක්ෂීන් හා හිස රතු කොට්ටෝරුවා හිස කළු කොන්ඩයා යන පක්ෂීන් මෙම උද්‍යානයේ දී දැකිය හැකි බව අපගේ මග පෙන්වන්නා පැවසුවේය. එන්න එන්නම අපගේ ගමන් මාර්ගය දුෂ්කර එකක් බවට පත්විය. එහෙත් නව නවත් සතුන් බලා ගැනීමේ රිසියෙන් වළ ගොඩැලි පසු කරමින් ඉදිරියට ඇදුනෙමු.

" ඔතන සමහර විට හැල කිඹුලා ඇති" සිඳුණු ඇළ මාර්ගයක් පෙන්වමින් මග පෙන්වන්නා කීවේය. අපි ඒ දෙසට ඇදුනෙමු. ස්වල්ප වේලාවක් අප එනන රැඳුනත් කිඹුලකු නම් දැක ගැනීමට හැකි නොවීය. දැවැන්ත කබරගොයකු නම් අප දැක ඈතට ඇදෙණු දැක ගැනීමට හැකිවිය.

වැව් තාඹුල්ලේ කෙළවරටම ගියෙමු. නැවත ආපසු හැරී ගමන් අරඹත්ම උකුස්සා දැක ගත හැකි විය. වැවේ ඉතිරි වී තිබූ ජලයේ සිටි තරමක මාළුවකු ඩැහැගත් උකුස්සා කොළ හැළුණු ගසක උඩ අත්තක සිට උගේ උදේ ආහාරයේ කොටස නිම කළේය.





ඒ එන විට හොඳ හැටි එළිය වැටී තිබිණි. මේ ගමන අතර තුර තනි අලි දෙතුන් දෙනකු ද දුටුවෙමු. එහෙත් සවස මින්නේරිය වැව් පිටිය අලි පාරාදීසයක් වනබව දැන සිටියෙමු. ඒ නිසා සවසට යළි වනයට එන අදහසක් ඇතිව ආපසු හැරුණෙමු. අප ආ ගිය මඟ දී තලගොයා, මුගටියා, විසිතුරු කටුස්සා, හීරලූවා වැනි උරගයින් දැක ගන්නට ලැබුණි. මුව රංචුවක් ද ගස් අතරේ සිටියහ. ඔවුන්ගේ විසිතුරු බලමින් වාහනය සෙමෙන් සෙමෙන් ඉදිරියට ඇදී ගියේය. එහෙත් පිඹුරා හා නයා වැනි සර්පයන් දැකීමට අපට අවස්ථාවක් ලැබුණේ නැත.

සවස 2.30 ට පමණ අලි බැලීමට පැමිණෙන බව පවසමින් අපගේ මඟ පෙන්වන්නාගෙනුත් සමුගෙන අපි තවාතැනට පැමිණියෙමු. දිවා ආහාරය ගෙන මඳ විවේකයක් ගෙන යළි වනෝද්‍යානය බලා පිටත්වීමු. ඒ සවස 2.30 ට පමණ ය.

මුහුදු මට්ටමේ සිට මීටර් 60 සිට මීටර් 300 පමණ උසට විහිදෙන කඳුවලින් ලඳු කැලෑවලින් සහ විවිධ තෘණ බිම්වලින් පෝෂිත උද්‍යානය තුළට පිවිසියෙමු.

අපුරුවට පායා තිබූ හිරු බැස යන්නට පටන් ගෙන තිබිණි. වැව් පිටියේ ඈත කෙළවරින් අලි එකා දෙන්නා මතු වන්නට වූහ. මිනිත්තු කිහිපයක් ගත විය. තිහ හතළිහක පමණ අලි රංචුවක් වැව් පිටියට පැමිණියේය. තවත් සුළු වේලාවකින් වනාන්තරයේ තවත් කෙළවරකින් තවත් අලි රංචුවක් මතු විය. අපි අනෙක් පස බැලූවෙමු. හරක් රංචුවක් වැව් පිටියට පිවිසෙමින් සිටියේය. දැන් වැව් පිටියේ අලි 300 ක් ඉතිරිව ගොස්ය. මේ අතර අලි බබාලා , අලි ගැටවූ බොහෝ දඟකාරකම් වල යෙදෙයි.

මින්නේරිය ජලාශයේ සිසිල දිය, අලි සඳහාම වෙන්වී තිබිණි. දිවාකාලයේ තෘණ බිම් වල සැරිසැරීම නිසා උණුසුම් වූ තම සිරුරුවලට සිසිලක් ලබා දීම සඳහා මෙතැන අලීන්ට විවේකී ස්ථානයක් විය.

අපත් සමඟ වාහන 50 ක් පමණ අලි සිරි නරඹමින් සිටියහ. එක් වාහනයක් අලින්ගේ විවේකයට බාධා කරමින් අලි අතරට යන්නට විය. දැවැන්තයෙක් හොඬ ඔසවා මහා හඬ නගා කුංච නාද කළේය. බිම පවුරු ගැවේය. වාහනය යාර පනහක් පමණ ආපස්සට ආවේය. දැවන්තයා ද හොඬවැල ඔසවා ඒ පසු ඇක්සලේටරයෙන් වේගය වැඩිකරගත් වාහනය දැවැන්තයාගෙන් ඈත් විය. ස්වභාවධර්මයේ නීතියක් හැටියට තම අසල්වැසියන් සමඟ වනයේ සාමකාමී ලෙස ජීවත්වීමට අලි පුරුදු වී සිටිති. ඔවුනට හිරිහැරයක් වුවහොත් මිස නිකරුණේ අලි කුලප්පු වන්නේ නැත.

දැන් අලි එකා දෙන්නා එතැන ඇති මඩ වළක මඩ ගා ගනිති. ඉන් පසු ඇදෙන්නේ මින්නේරිය ජලාශය වෙතය," හරියට අපි සබන් ගාල නානවා වගේ " අපේ මඟ පෙන්වන්නා කීවේය. දැන් අලි බබාලාගේ සෙල්ලම් තරග වේලාවය. නමුත් අලි අම්මලා ඔවුන් දෑස් මානයෙන් ඈතට නොඅරිති. තවත් ....... අලි පැටියෙක් අම්මාගෙන් කිරි උරා බොන අයුරු ඉතාම සුන්දරය. ගැටවර වයසේ අලින් දෙදෙනෙක් පොඩි රංචුවක්ය. " ඒ නම් වයසේ වැරැද්දය. සහකාරියක් සොයා ගැනීමට ද දන්නැ" අපේ කණ්ඩායමේ කෙනෙක් කියනවා ඇසුණි.

ඒ රාස්සිගේ අව්ව වැටෙන වේලාවයි. අඳුර දස අත පැතිරෙමින් තිබිණි. දැන් වාහනයෙන් පිටතට පැමිණිය යුතු යැයි මගපෙන්වන්නා කීවේය. අපට වේලාව ගතවන බවක් නම් නොහැඟිණි. අලි කොච්චර බැලූවත් ඇතිවන්නේ නැති තරම්ය. ❑

**ඉන්දික කුඩාහෙට්ටි**

**ඡායාරූප - සුජීව**

